
වාර්ෂික වාර්තාව සහ ගිණුම්

ஆண்டறிக்கையும் கணக்குகளும்

ANNUAL REPORT & ACCOUNTS

01-04-2019---31-03-2020



මාන්තායි සෝල්ට් ලිමිටඩ්

மாந்தை உப்பு லிமிற்றெட்

MANTAI SALT LIMITED

මාන්තායි සෝල්ට් ලිමිටඩ්

மாந்தை சோல்ட் லிமிட்டெட்

MANTAI SALT LIMITED

කර්මාන්ත අමාත්‍යාංශය

கைத்தொழில் அமைச்சு

Ministry of Industries

රජයට අයත් සමාගමකි

அரசுக்குச் சொந்தமான கம்பனி

Government Owned Company

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

ஆண்டறிக்கையும் கணக்குகளும்

ANNUAL REPORT & ACCOUNTS

2019.04.01 – 2020.03.31

පටුන

1.	සභාපතිතුමාගේ සමාලෝචනය	01
2.	සාමාන්‍යාධිකාරිතුමන්ගේ පණිවිඩය	03
3.	සංස්ථාපිත තොරතුරු	04
4.	හැඳින්වීම 4.1 සමාගම් ව්‍යුහය 4.2 නිෂ්පාදන වැඩ බිම් සම්බන්ධ තොරතුරු 4.3 නිෂ්පාදන විස්තර 4.4 අලෙවිය	05 05 07 07 07
5.	සංවර්ධනය කිරීම සඳහා දැනට පවතින ප්‍රධාන ක්ෂේත්‍ර 5.1 මෙම සංවර්ධන කටයුතු වල සැලකිය යුතු ප්‍රතිදානය	 08
6.	මූල්‍ය සාරාංශය	09
7.	ප්‍රධාන මාණ්ඩලික නිළධාරින්ගේ විස්තර	10
8.	සංවිධාන ව්‍යුහය	11
9.	අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව	12
10.	කොටස් හිමිකරුවන් වෙත ස්වාධීන විගණක වාර්තාව	14-22
11.	විගණනය කරන ලද ගිණුම් 2019/2020	23-59

1. සභාපතිතුමාගේ සමාලෝචනය

ජාතික ලුණු සමාගමේ වර්තමාන සභාපති වශයෙන් මම, 2019/2020 වර්ෂය සඳහා සමාගමේ වාර්ෂික ගිණුම් පිළිබඳ මාගේ සමාලෝචනය මෙයින් ඉදිරිපත් කරමි. සමාගමේ 2019/2020 වාර්ෂික මහා සභා රැස්වීමට ඔබව සාදරයෙන් පිළිගැනීමට ලැබීම ගැන ද, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම ගැන ද මම සතුටට පත් වෙමි.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනය රු103,473,982 ක පිරිවැටුමක් සාක්ෂාත්කර කරගෙන ඇති අතර, 2019/2020 වර්ෂයේ බදු ගෙවීමට පෙර ලාභය වශයෙන් රු. 12,298,244.00 ක් උපයා ඇත. පසුගිය වර්ෂයේ මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනයේ පිරිවැටුප රු155,380,640 ක් වන අතර, වර්ෂයේ බදු ගෙවීමට පෙර ලාභය වශයෙන් රු.41,736,177 ක් උත්පාදනය කර ඇත. 2019 වර්ෂයේ දී පුත්තලම් ප්‍රදේශයේ ලුණු ලේවායන් හී අති විශාල අස්වැන්නක් ලැබීම සහ ලුණු වල මිළ ගණන් පහල බැසීම නිසා ආදායමේ අඩුවීමක් සිදු වී ඇත. ආරම්භයේ සිටම අපගේ කාර්ය සාධනය දෙස ආපසු හැරී බලන විට පසුගිය වසර දෙක තුළ දී අපගේ නිශ්පාදන ධාරාතාවයේ ඉහලයාමේ කාර්ය සාධනය පිළිබඳව අපට සාධාරණීකරණය කළ හැකිවාක් මෙන්ම අඩම්බර විය හැකිය. රාජ්‍ය බදු වශයෙන් සමාගම රු. 1,959,638 ක මුදලක් ගෙවා ඇත.

ශ්‍රී ලංකාවේ ලුණු කර්මාන්තය සක්‍රීය ලෙස සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම සඳහා පහසුකම් සපයන්නා ලෙස කටයුතු කිරීමට සමාගමට හැකි වූ බව කොටස් හිමියන්ට වෙත මම සතුටින් දන්වා සිටිමි .2019/2020 වර්ෂය තුළ දී ලබාගන්නා ලද ප්‍රතිඵලයන්ට අනුව කොටසක ඉපැයුම රු 42.65. විය.

වර්ෂය සඳහා අනුමත කරන ලද මුළු සේවක සංඛ්‍යාව 167 ක් විය 2020.03.31 දින වන විට සිටි ස්ථිර සේවක සංඛ්‍යාව 62කි. සෑම ස්ථරයකම සිටින සියලුම සේවකයින්ගේ පූර්ණ සහයෝගය අඛණ්ඩව අප වෙත ලැබෙන බව දන්වා සිටින්නේ සතුටිනි.

මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනයෙහි අපේක්ෂිත අරමුණු සාර්ථකව ඉටු කර ගැනීම සඳහා නව ස්කන්ධ ප්‍රාග්ධනයක් යෙදවීම තුළින් එහි වර්තමාන ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.

කෙසේ වෙතත්, නව සභාපතිවරයා ලෙස, මම 2022 පෙබරවාරි මාසයේ රාජකාරි භාර ගනිමි. මා විසින් රැස් කර ගන්නා ලද තොරතුරු වලට අනුව, ලුණු දෙපාර්තමේන්තුවෙන් ආරම්භ වූ සමාගම ආරම්භයේ පටන් අගය එකතු කළ ලුණු වෙනුවට සකස් නොකළ ලුණු විකිණීම කෙරෙහි අවධානය යොමු කර ඇත. වෙළෙඳපොළ සඳහා මේස ලුණු නිෂ්පාදනය කිරීමට මේ තාක් අපට නොහැකි වී ඇත. එබැවින් අගය එකතු කළ නිෂ්පාදනයන් ආරම්භ කිරීම මගේ ප්‍රධාන කාර්යය වන අතර ඊට අමතරව මා විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

1. වැඩි ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තු මට්ටමින් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම.
2. නව තාක්ෂණය භාවිත කිරීම මඟින් පවතින භූමි ප්‍රමාණය භාවිත කරමින් නිෂ්පාදනය වැඩි කිරීමට සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම

3. ලුණු ලේවායන්හි භාවිතයට නොගත් සියලුම ඉඩම් සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගන්නෙමි.

4. අගය එකතු කිරීමේ ක්‍රියාවලිය හරහා මේස ලුණු පැකට්ටුවක් කඩිනමින් වෙළෙඳපොළට හඳුන්වා දීමට කටයුතු කිරීම.

5. අපනයන වෙළෙඳපොළ සහ ආහාර කර්මාන්තය ඉලක්ක කර ගනිමින් පිරිසිදු රික්ත ශෝධක වියළි ලුණු (PVD) යන්ත්‍රෝපකරණ ස්ථාපනය කිරීම මගින් සකස්කළ ලුණුවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ ISO ප්‍රමිතිය ලබා ගැනීම.

6. දිවයින පුරා බෙදාහැරීමේ ජාලය ක්‍රියාත්මක කිරීම.

7. උපරිම වෙළඳපල කොටස් ලබා ගැනීමට සහ දේශීය වෙළඳපොලේ අංක 1 වෙළඳ නාමය ලෙස අපගේ ලුණු සන්නාම ගත කිරීමට, වැඩි පිළිගැනීමක් ලබා ගැනීම සඳහා දැනට පවතින වෙළඳ නාමය "ජාතික ලුණු" ලෙස වෙනස් කිරීමට යෝජනා කර ඇත.

8. ජාතික ලුණු සමාගමේ තිරසාරභාවය සඳහා කුරිංවතිව් ලුණු ලේවාය ජාතික ලුණු සමාගම මඟින් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ට.

9. කොටස් හිමියා සඳහා එනම් භාණ්ඩාගාරය සඳහා ලාභාංශ ගෙවීම වැඩි කිරීම ට.

10. ලුණු ලේවායන් පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා සේවක සංඛ්‍යාව සම්පූර්ණ කිරීමට, විනය සංග්‍රහ සකස් කිරීමේ කටයුතු අවසන් කිරීම සහ ජාතික ලුණු සමාගමේ කාර්ය මණ්ඩලය සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය සමඟ සුබසාධන පහසුකම් සංවර්ධනය කිරීම ට.

කර්මාන්ත අමාත්‍යාංශයේ, ගරු අමාත්‍ය තුමා, ලේකම් සහ කාර්ය මණ්ඩලය ද, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ, මුදල් අමාත්‍යාංශයේ, රාජ්‍ය අධිකාරින් හි කාර්ය මණ්ඩලය මෙන්ම ගනුදෙනුකරුවන් විසින් අප වෙත ලබා දෙන අඛණ්ඩ දිරිගැන්වීම් සහ සහයෝගය පිළිබඳව ද අපි සතුටට පත් වන්නෙමු.
මේ අනුව මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනය අපට ඇති සියළුම අභියෝගයන්ට මුහුණ දීමට සහ අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවන් සම්බන්ධයෙන් කඩිනමින් හා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට සූදානම් වන අතර, එමඟින් ආයතනයේ අඛණ්ඩ සාර්ථකත්වය සහතික කෙරේ.

ජාතික ලුණු සමාගම වෙනුවෙන් තම දායකත්වය ලබාදුන් සියලුම සභාපතිවරුන්ට, විශේෂයෙන්ම තම සේවා කාලය තුළ ජාතික ලුණු සමාගම වෙනුවෙන් තම දායකත්වට ලබා දුන් හිටපු සභාපතිවරුන් වන එම්.එම්. අමීන් සහ එච්.ජී. විජේතුංග යන මහත්වරුන්ට සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින මගේ සහයකයින්ට සහ කළමනාකාරීත්වයට සහ කාර්ය මණ්ඩලයට, ඔවුන් මා වෙත දක්වන ලද සහයෝගය වෙන්වෙන් මාගේ අවංක ස්තුතිය පුද කර සිටිමි..

ඒ.ජී. මොරගොඩ

සභාපති

2. සාමාන්‍යාධිකාරීතුමන්ගේ පණිවිඩය

මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනය විසින් 2019 අප්‍රේල් 01 දින සිට 2020 මාර්තු 31 දින දක්වා කාලය තුළ දී සිය ක්‍රියාකාරකම්, කාර්යයන් අඛණ්ඩව සිදුකරගෙන යාම සහ ලාභ උපයා ගැනීම සම්බන්ධ වාර්ෂික මහා සභා රැස්වීමේදී මගේ පණිවිඩය ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද මහඟු අවස්ථාවකි.

පවත්නා මූල්‍ය වර්ෂයේදී මන්නාරම ලුණු ලේවාය සහ අලි මංකඩ ලුණු ලේවාය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි විය. 2015 ජනවාරි මස 15 දිනැති අංක 1897/ 15 දරණ අති විශේෂ ගැසට් නිවේදනයට අනුව, 2015 පෙබරවාරි මස සිට අලිමංකඩ ලුණු ලේවායේ පරිපාලන කටයුතු නැවතත් මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනය යටතට පත්විය. මහා භාණ්ඩාගාරයේ මූල්‍ය සහයෝගය ඇතිව සිදුකෙරෙන එහි ප්‍රතිසංස්කරණ කටයුතුවලින් 80% ක් අවසන් කිරීමට ඇත.

2019/2020 වර්ෂය සඳහා අයවැයගත ප්‍රමාණය වූ මෙ.ටො.5500 ට සාපේක්ෂව, මෙම මූල්‍ය වර්ෂය තුළ දී මන්නාරම ලුණු ලේවායෙහි ලුණු මෙට්‍රික් ටොන් 6683ක් නිෂ්පාදනය කිරීමට අපගේ කණ්ඩායමට හැකි වූ අතර, අයවැයගත ප්‍රමාණය වූ මෙ.ටො. 15,000 ට සාපේක්ෂව 2019/2020 වර්ෂය සඳහා ලුණු මෙට්‍රික් ටොන් 16,089 ක් අලි මංකඩ ලුණු ලේවායෙහි නිෂ්පාදනය කිරීමට හැකි විය. අයවැයගත ප්‍රමාණය වූ මෙ.ටො.5500 ට සාපේක්ෂව මන්නාරම ලුණු ලේවායෙන් ලුණු මෙට්‍රික් ටොන් 7014 ක් ද අයවැයගත ප්‍රමාණය වූ මෙ.ටො. 15,000 ට සාපේක්ෂව එලිපත්ථිපාස් ලුණු ලේවායෙන් ලුණු මෙට්‍රික් ටොන් 6049 ක් ද, කි.ග්‍රෑ. 1 පැකට් කරන ලද සාමාණ්‍ය ලුණු සහ අයඩින් මිශ්‍ර ලුණු, සහ කාර්මික ලුණු සහ කැට ලුණු යන ආකාරයට අලෙවිකරන ලද අතර, වර්ෂය සඳහා මුළු ශුද්ධ පිරිවැටුම රුපියල් මිලියන 103.47 කි. සකස් කරන ලද ගිණුම් අනුව මෙම වසර සඳහා බදු ගෙවීමට පෙර තථ්‍ය ලාභය රුපියල් 12,298,244 කි.

අපගේ සමාගම සාධාරණ මිලකට ලුණු විකිණීමෙන් පාරිභෝගිකයින්ට සේවා සැපයීම සිදු කරනවා පමණක් නොව, ආදායම් බදු ලෙස රුපියල් මිලියන 1.95ක් රජයට ගෙවා ඇති අතර, තවද සාධාරණ ලාභාංශ ප්‍රමාණයක් භාණ්ඩාගාරයට ගෙවීම ද සිදු කරනු ලබන බව ඉතා ආඩම්බරයෙන් ප්‍රකාශ කර සිටිමි.

2024 වර්ෂය වන විට ශ්‍රී ලංකා වෙළඳපලින් 18% ක් සපයනු ලබන ප්‍රධාන ලුණු නිශ්පාදකයා බවට මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනය පත් කිරීමට කළමනාකරණය අරමුණු කර ඇත.

මෙම මූල්‍ය වර්ෂය තුළ දී සේවය කරන ලද කාර්ය මණ්ඩලය, ඉලක්ක සඳහා පුහුණු කිරීම, ඇගයීම, මූලික පහසුකම් සැපයීම, ප්‍රසාද දීමනා ගෙවීම යනාදී කටයුතු මඟින් බලගන්වා ඇත.

අවසාන වශයෙන්, මෙම සමාගමේ සාර්ථකත්වය සඳහා ඔවුන්ගේ හෘදයාංගම දායකත්වයක් ලබා දීම වෙනුවෙන් මම කර්මාන්ත අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමන්ට සහ ලේකම්තුමාටත්, ආයතනයේ සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය සහ මාගේ කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය ප්‍රකාශ කර සිටිමි.

එම්.ජේ. තුවාන් මන්සිල්
සාමාන්‍යාධිකාරී

3. සංස්ථාපිත තොරතුරු

සමාගමේ නම	මාන්තායි සෝල්ට් ලිමිටඩ් (රජය සතු සමාගමකි)
රේකීය අමාත්‍යාංශය	කර්මාන්ත අමාත්‍යාංශය
ප්‍රධාන කාර්යාලය	561/3, ඇල්විටිගල මාවත.05 කොළඹ ,
මන්නාරම ලුණු ලේවාය	ග්‍රෑන්ඩ් බසාර්, මන්නාරම.
අලි මංකඩ ලුණු ලේවාය	A9 මාර්ගය, අලි මංකඩ, කිළිනොච්චි
සමාගමේ ලියාපදිංචි අංකය	[N(PBS)942] නව අංකය: PB 1078
කොටස් හිමිකරුවන්	මහා භාණ්ඩාගාරය
	1. එම්.එම්. අමීන් මහතා (සභාපති) 2. පී.ඒ.එස්.ඒ. කුමාර මහතා (අධ්‍යක්ෂ - භාණ්ඩාගාරය) 3. එම්.එම්.එම්.උවයිස් මහතා 4. ආචාර්ය එස්. මහේන්තිරන් මහතා 5. එස්.ජයරත්න මහතා 6. එස්.ජේ. මාර්ක් මහතා 7. ජේ. එම්. පීරිස් මහතා
අධ්‍යක්ෂ මණ්ඩලය	2020 පෙබරවාරි මස සිට 1. එච්.පී. විජේතුංග මහතා - සභාපති 2. ආර්.ඩී.එම්.යූ.එස්.සී. බණ්ඩාර මහතා (-භාණ්ඩාගාරය) 3. ඩබ්. පී. හපුආරච්චි මහතා 4. ශාන්ත කුමාර මහතා 5. ආචාර්ය එස්.එම්.ජේ. ධර්මකීර්ති මහතා
නිරීක්ෂක	ඒ. සොයිසා මිය (කර්මාන්ත අමාත්‍යාංශය)
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	කෝපරේට් එෆයාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
විගණක	රජයේ විගණකවරුන් ජාතික විගණන කාර්යාලය, ශ්‍රී ලංකාව
බැංකුකරු	ලංකා බැංකුව

4. හැඳින්වීම

4.1 සමාගම් ව්‍යුහය

ශ්‍රී ලංකාවේ ලුණු නිශ්පාදනය සම්බන්ධයෙන් දීර්ඝ ඉතිහාසයක් මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනය සතුව ඇත. එම ආයතනය සාමාන්‍ය ලුණු, අයඩින් ලුණු, කැට ලුණු සහ කාර්මික ලුණු නිශ්පාදනය කරනු ලබයි. එහි ප්‍රධාන නිශ්පාදන බිම් මන්නාරම සහ අලි මංකඩ යන ප්‍රදේශවල පිහිටා ඇති අතර, එහි පරිපාලන කාර්යාලය කොළඹ පිහිටා ඇත. අලි මංකඩ ලුනු ලේවාය නැවතත් මෙම සමාගමේ පරිපාලනය යටතට පවරාගෙන ඇති අතර, එහි නිශ්පාදන කටයුතු 2016 වසරේ මැද භාගයේ සිට ආරම්භ කරන ලදී.

ලුණු සංස්ථාව 1938 වර්ෂයේ දී ආරම්භ කර ඇති අතර, විවිධ වූ පරිපාලන අධිකාරීන් යටතේ පැවති එය අවසානයේ දී 2001 වර්ෂයේ සිට මාන්තායි සෝල්ට් ලිමිටඩ් ලෙස නම් කරන ලදී. වර්තමානයේ එය කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක් වේ. මෙම සමාගම විසින් නිශ්පාදනය කරනු ලබන ලුණු දිවයිනේ අනෙකුත් ප්‍රදේශවලින් නෙලාගන්නා ලුණු හා සැසඳීමේ දී ගුණාත්මක බවින් ඉතාම ඉහල අගයක ඇති බව පිළිගැනේ. (එහි 96.5% ක් සෝඩියම් ක්ලෝරයිඩ් වේ)


මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනය ස්වාභාවික සම්පත් උපයෝගීතා මධ්‍යස්ථානයක් ලෙස පමණක් නොව, මන්නාරම සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයන් හි අවදානමට ලක් වූ (පීඩිත) ජනතාවන්ට රැකියා අවස්ථාවන් ද ලබා දෙන මධ්‍යස්ථානයක් ලෙස ද ක්‍රියාත්මක් වේ. මේ වන විට 62 දෙනෙකුගෙන් සමන්විත වන ස්ථීර කාර්ය මණ්ඩලයක් සිටින අතර, පුද්ගලයින් 150 දෙනෙකුගෙන් සමන්විත වන තාවකාලික කාර්ය මණ්ඩලයක් ආයතනය විසින් සේවයේ යොදවා ඇත.

මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනය, මහා භාණ්ඩාගාරයේ සහ අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල සාමාජිකයින්ගෙන් සැදුම්ලත් මණ්ඩලය විසින් පාලනය වන අතර, එය කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ. සමාගමේ නෛතික සහ වගකිවයුතු කාර්යයන් සම්බන්ධ අධීක්ෂණ කටයුතු සහ පහසුකම් සැපයීමේ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිව්‍යුහගත සහ රාජ්‍ය ව්‍යවසාය අංශය විසින් සිදු කරනු ලබයි. එය රාජ්‍ය ව්‍යාපාරයක් බැවින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස සමාගම් නීති රීති වලට අනුකූලව ලියාපදිංචි කර ඇත. මේ අතර අගය එකතු කළ නිෂ්පාදනයන් හී ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා මෙම ආයතනය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සහතික කරනු ලැබේ. එසේම 2015 වර්ෂයේ සිට මේ දක්වා සමාගම රජයේ විගණකවරුන් විසින් විගණනය කරනු ලැබේ.

සමාගමේ ඉතිහාස තොරතුරු

වර්ෂය		ආයතනයේ නම
සිට	දක්වා	
1938	1965	ලුණු දෙපාර්තමේන්තුව
1966	1990	ශ්‍රී ලංකා ජාතික ලුණු සංස්ථාව
1991	1996	ලංකා සෝල්ට් ලිමිටඩ්
1997	2001/සැප්.	මන්නාරම දිසාපති යටතේ මන්නාරම ලුණු ලේවාය
2001/ඔක්.	මේ දක්වා	මාන්තායි සෝල්ට් ලිමිටඩ් (උතුරු පළාතේ පිහිටි ලුණු ලේවායන්)

දැක්ම



ව්‍යාපාරයේ ස්වභාවය අනුව සමාගම පහත පරිදි දැක්මකින් යුක්ත ය.

"රසායනික හා වෙනත් ක්‍රියාවලීන් හා සම්බන්ධ ස්වාභාවික සම්පත් ගවේෂණය කිරීමෙන් උතුරු පළාතේ ලුණු ආශ්‍රිත ව්‍යවසායන් සංවර්ධනය කිරීම සහ එමඟින් ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම".

මෙහෙවර

සමාගමේ මෙහෙවර පහත පරදි වේ .

"ලුණු ලේවායන් මෙහෙය වීම, ලුණු නිශ්පාදනය, අගය එකතු කිරීම සහ ලුණු සහ අතුරු නිශ්පාදන අලෙවි කරණය"

4.2 නිශ්පාදන වැඩ බිම් සම්බන්ධ විස්තර

අ) මන්නාරම ලුණු ලේවාය

මන්නාරම ලුණු ලේවායේ සම්පූර්ණ නිශ්පාදන භූමි ප්‍රමාණය අක්කර 163 කි. වාර්ෂික ලුණු නිශ්පාදනය ආසන්න වශයෙන් මෙ.ටො. 6000 ක් වන අතර එය ශ්‍රී ලංකාවේ මුළු ලුණු නිශ්පාදනයෙන් 3.3% ක් වේ. ලාභ ඉපැයීමේ ආයතනයක් ලෙස මෙම ආයතනය තම ලාභය මඟින් සිය කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම හා සුභ සාධන කටයුතු සමඟ ම ආයතනයේ යම් සංවර්ධන හා නඩත්තු කටයුතු සිදු කරයි.

ආ) අලිමංකඩ ලුණු ලේවාය

අලිමංකඩ ලුණු ලේවායේ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන නිශ්පාදන භූමි ප්‍රමාණය අක්කර 750 වන අතර, නිශ්පාදන ධාරිතාව සාමාන්‍යයෙන් වසරකට මෙ.ටො. 25,000 කි.

මෙම ලුණු ලේවායේ නවීකරණ කටයුතුවලින් 80% ක් දක්වා සාර්ථකව නවීකරණය කර ඇති අතර, 2016 වසරේ සිට නිශ්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර 2019/20 වන විට මෙ.ටො.16,089ක නිශ්පාදනයක් සාක්ෂාත් කරගෙන ඇත.

වර්තමානයේ මෙම ලුණු ලේවායන් දෙකෙහිම සාමාන්‍ය ලුණු නිශ්පාදන කරන අතර, නුදුරු අනාගතයේ දීම මේස ලුණු යන්ත්‍රාගාර ස්ථාපිත කිරීම මඟින් අගය එකතු කිරීමේ ක්‍රියාවලියක් මහා පරිමාණයෙන් සිදු කිරීමට සැළසුම් කරමින් පවතී.

4.3 නිශ්පාදන විස්තර

ලුණු ලේවාය	2015/2016	2016/2017	2017/2018	2018/2019	2019/2020
මන්නාරම	3320	6045	6284	6249	6683
අලි මංකඩ		1048	7130	10314	16089
එකතුව	**3320**	**7093**	**13414**	**16,563**	**22772**

4.4 අලෙවිය

වර්ෂය	අලෙවිය(මෙ.ටො.)	ආදායම(මිලි.) රු.
2014/2015	5176	49.0
2015/2016	5063	62.3
2016/2017	3337	93.8
2017/2018	6094	83.7
2018/2019	16,146	155.38
2019/2020	13063	103.47

5. යෝජිත අනාගත සංවර්ධන යන්ත්‍රාගාර

අ) මන්නාරම ලුණු ලේවාය

1) සමාගම පැයට මෙ.ටොන් 02 ක් නිපදවන ස්ථටික ලුණු යන්ත්‍රෝපකරණ සාර්ථකව ස්ථාපනය කර ඇත. මේ වන විට ඇසුරුම් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, දිස්ත්‍රික්කය තුළ බෙදාහරින්නන් සහ තොග වෙළඳුන් මගින් විකිණීම සිදු කරනු ලබයි.
සමාගම වසරකට මෙට්‍රික් ටොන් 3000ක් සඳහා ස්ථටික ලුණු පැකට් කිරීමේ ක්‍රියාවලිය පුළුල් කිරීමේ කටයුතුවල නිරතව සිටින අතර, ඒ අනුව අලෙවිකරණ සහ විකුණුම් ඒකකයක් සංවර්ධනය කරමින් පවතී.
තවද, මේස ලුණු යන්ත්‍රාගාරයක කොටසක් සවි කිරීම මගින් යන්ත්‍රාගාරය වැඩිදියුණු කර මේස ලුණු නිෂ්පාදනය කිරීමට සැලසුම් කර ඇත.

2) මන්නාරම ලුණු ලේවායේ පරිපාලන කටයුතු සඳහා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට නියමිතය.

3) මන්නාරම ලුණු ලේවාය සඳහා ක්ෂේත්‍ර කාර්යාලය ඉදිකිරීමට නියමිතය.

ආ) අලි මංකඩ ලුණු ලේවාය

1. අක්කර 750 ක භූමි ප්‍රදේශයක නිශ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා පූර්ණ ධාරිතාවයෙන් යුතු ලුණු ලේවාය පුනරුත්තාපනය කිරීම.
2. පැයකට මෙ.ටොන් 05ක ධාරිතාවයෙන් යුත් මේස ලුණු කම්හලක් ස්ථාපනය කිරීමට කටයුතු කරමින් පවතී..

5.1 මෙම සංවර්ධන කටයුතුවල සැළකිය යුතු ප්‍රතිදානය.

- නව යන්ත්‍රාගාර මගින් නිපදවන ස්ථටික ලුණු නිශ්පාදනය සහ අලෙවිය, වෙළඳපළ ව්‍යාප්ත කිරීමට සහ පුළුල් කිරීමට උපකාරී වන අතර, එමගින් වෙළඳපල තුළ සමාගමේ ශක්‍යතාව සහතික කෙරේ.

- අලෙවිය වැඩි කිරීම සහ කඩිනම් කිරීම මගින් තොග ගබඩා කිරීමේ සහ රඳවා තබා ගැනීමේ කාල සීමාවන් අඩු කිරීමට හැකි වේ.

- අවශ්‍යතා පුළුල් කිරීම මත රැකියා අවස්ථා නිර්මාණය කෙරේ.

- වැඩිවන ලාභය මගින් සේවකයින්ට වැඩි සුභසාධන පහසුකම් සහ ප්‍රතිලාභ ලබා දීමට මූලික වේ.

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිර්ණායක සපුරාලන අතර ගුණාත්මකභාවය පවත්වාගෙන යනු ලැබේ.

- ග්‍රාමීය වෙළඳපොලේ නිෂ්පාදන සාධාරණ මිලකට ලබා දීම මඟින් අයඩින් ඌනතා ගැටලුව තුරන් කිරීම සඳහා නිෂ්පාදන හා සිල්ලර වෙළඳාම දායක වේ.

- සැලකිය යුතු ලාභාංශ භාණ්ඩාගාරයට ගෙවනු ලබන අතර, මහජනතාවට අවසාන ප්‍රතිලාභය ලබා දෙනු ලබන ජාතික සංවර්ධනය සඳහා වන වැට් හා ජාතිය ගොඩ නැගීමේ බදු වැනි බදු රජයට ලැබෙනු ඇත.


6. මූල්‍ය සාරාංශය

මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	ඒකක	2019/2020	2018/2019	**2017/2018**	2016/2017	2015/2016	2014/2015
නිෂ්පාදනය	මෙ.ටො.	22,772	16,563	13,414	7,093	3,320	5,220
අලෙවිය	මෙ.ටො	13,063	16,146	6,094	3,337	5,063	5,176
ආදායම	රු.	103,473,982	155,380,640	83,796,285	93,873,827	62,370,254	49,018,196
දළ ලාභය	රු.	19,170,216	47,041,469	36,053,276	49,613,129	13,190,129	21,194,992
ශුද්ධ ලාභය	රු.	12,796,333	35,176,712	27,789,256	33,516,078	275,429	4,457,567
ශුද්ධ වත්කම්							
ජංගම නොවන මුළු වත්කම්	රු.	149,768,539	198,751,368	160,315,681	116,333,097	99,832,834	99,767,254
මුළු ජංගම වත්කම්	රු..	146,737,592	103,592,678	115,702,454	48,219,902	35,129,574	23,177,470
අඩුකළාජංගම - නොවන වගකීම්	රු..	(9,296,086)	(11,387,535)	(10,433,573)	(9,440,173)	(9,072,218)	(8,251,015)
අඩුකළා-ජංගම වගකීම්	රු.	(12,657,428)	(19,574,079)	(24,752,393)	(12,105,527)	(16,398,968)	(5,216,777)
		274,552,617	**271,382,432**	**240,832,169**	**143,007,300**	**109,491,222**	**109,476,932**
කොටස් හිමියන්ගේ අරමුදල්							
නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය	රු..	30,000,000	30,000,000	30,000,000	30,000,000	30,000,000	30,000,000
සංචිත	රු.	244,552,617	241,382,432	210,832,169	113,007,300	79,491,222	79,476,932
		274,552,617	**271,382,432**	**240,832,169**	**143,007,300**	**109,491,222**	**109,476,932**
රජයට ආදායම්							
ආදායම් බදු	රු..	(498,090)	6,559,465	5,237,520	4,869,106	532,349	3,597,467
කොටසක ඉපැයුම්	රු.	42.65	117.25	92.63	111.72	1.00	14.86

7. ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්ගේ විස්තර

නම	තනතුර	සුදුසුකම්	මාන්කායි සොල්ට් ලිමිටඩ් හි සේවා කාලය
එම්.ජේ. තුවාන් මන්සිල් මහතා	සාමාන්‍යාධිකාරී	BSc. MBA, Dip in HRM, Dip in Eng. AAT-1	2014 සැප්තැම්බර් මස සිට
ආර්.වී. විනෝහරන් මහතා	මූල්‍ය කළමනාකරු	ACMA	2017 ජනවාරි මස සිට
ඒ.කිෂෝතරන් මහතා	කළමනාකරු- ලුණු ලේවාය	B.Sc /PGD	2008 අප්‍රේල් මස සිට
ඩී.ජේ.එච්.එස්. පුෂ්පකුමාර මහතා	සහකාර මූල්‍ය කළමනාකරු	CASL (Inter)	2019 පෙබරවාරි මස සිට
එම්.එෆ්. ෆහිසාල් මහතා	සහකාර කළමනාකරු - ලුණු ලේවාය	Dip in Mec Eng.	2010 නොවැම්බර් මස සිට
ආර්. ෆාතිමා රාසික් මිය	සහකාර කළමනාකරු- පරිපාලන	B.A /Dip HR	20 16අගෝස්තු මස සිට
එස්.ජේ. ජීනදාස මිය	අභ්‍යන්තර විගණන නිලධාරී	G.C.E. Advance level AAT satge 1& 2 & Dip in HR	20 12අප්‍රේල් මස සිට
ඊ. විජයාන් මයා	සහකාර කළමනාකරු- ලුණු ලේවාය	G.C.E. Advance level	2002 අප්‍රේල් මස සිට

8. සංවිධාන ව්‍යුහය


සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
සාමාන්‍යාධිකාරී
HM 1-3
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
-01
HM 1-1
මූල්‍ය කළමනාකරු -01 MM 1-1
පිරිවැය ගිණුම් කළමනාකරු - 1 MM-1
අලෙවි කළමනාකරු MM 1-1
කළමනාකරු ලුණු ලේවාය 02 MM 1-1
පරිපාලන කළමනාකරු 01 MM 1-1
අභ්‍යන්තර විගණක MM1-1 - 01
ස. මූල්‍ය කළමනාකරු -01 JM1-1
ස. අලෙවි කළමනාකරු 01
ස. ත. පාලන කළමනාකරු ලුණු ලේවාය 01
ස. කළමනාකරු ලුණු ලේවාය -05
ස. පරිපාලන කළමනාකරු - 01 JM1-1
අභ්‍යන්තර විගණන නිලධාරී -01 JM1-1
තාක්ෂණ නිලධාරී 01
ලුණු ලේවා නිලධාරී (07) MA 2-1
ලබඩා භාරකරු (03) MA2-1
කළමනාකරණ සහකාර (07 MA 1-1
කළමනාකරණ සහකාර (04) MA 1-1
ආරක්ෂක ස්ථානභාර නිලධාරී (02) MA 1-2
කළමනාකරණ සහකාර (7) MA 1-1
කළමනාකරණ සහකාර (01) MA 1-1
ප්‍රාථමික මට්ටම අඩ පුහුණු (14)
ස. කාර්මික ශිල්පී -03
ස. ගබඩා පාලක 03
පොම්ප ක්‍රියාකරු - 08
PL-2
ප්‍රාථමික මට්ටම පුහුණු (23)
රියදුරු 06
කාර්මික ශිල්පී -2
විදුලි කා. ශිල්පී -3
අධීක්ෂක - 8
තාක්ෂණ ශිල්පී 2
((විද්‍යාගාර සහ වාරිමාර්ග)
කාර්මික ශිල්පී - 2
(සිවිල්)
PL-3
ප්‍රාථමික මට්ටම නුපුහුණු (75)
කාර්යාල සහයක - 6
කම්කරු -61
ආරක්ෂක -08
PL-1
අධ්‍යක්ෂ (04)

8. <u>අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව</u>

සමාගමේ අධ්‍යක්ෂවරු විසින් 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද ශේෂ පත්‍රය සහ ආදායම් ප්‍රකාශණය සමඟ ඔවුන්ගේ වාර්තාව ද මේ සමඟ ඉදිරිපත් කරති.

<u>ප්‍රධාන ක්‍රියාකාරකම්</u>

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ ලුණු නිෂ්පාදනය හා අලෙවියයි.

සමාගමේ අධ්‍යක්ෂවරු විසින් 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද ශේෂ පත්‍රය සහ ආදායම් ප්‍රකාශණය සමඟ ඔවුන්ගේ වාර්තාව ද මේ සමඟ ඉදිරිපත් කරති.

<u>මූල්‍ය සාරාංශය</u>

2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය

	රු.
ලුණු අලෙවිය	103,473,982
මුළු පිරිවැටුම	103,473,982
විකුණුම් පිරිවැය	84,303,766
දල ලාභය	19,170,216
කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය / (බදු ගෙවීමෙන් පසු)	**12,796,334**
කොටසක ඉපැයීම	42.65

<u>අධ්‍යක්ෂවරු.</u>

2019/20 වර්ෂය තුළ සමාගමේ අධ්‍යක්ෂවරුන් ලෙස ක්‍රියා කළ නිලධාරීන් පහත දැක්වේ.

01. එම්.එම්. අමීන් මහතා (සභාපති)
02. පී.ඒ.එස්.ඒ. කුමාර මහතා (අධ්‍යක්ෂ - භාණ්ඩාගාරය)
03. එම්.එම්.එම්.උවයිස් මහතා
04. ආචාර්ය එස් මහේන්තිරන් මහතා
05. එස්.ජයරත්න මහතා
06. එස්.ජේ.මාර්ක් මහතා (විධායක අධ්‍යක්ෂ)
07. ජේ. එම් පීරිස් මහතා
08. ඩබ්.එන්. අංජලී සොයිසා මිය - නිරීක්ෂක

2020 පෙබරවාරි මස සිට

1. එච්.ජී. විජේතුංග මහතා - සභාපති
2. ආර්.ඩී.එම්.යූ.එස්.සී. බණ්ඩාර මහතා - භාණ්ඩාගාරය
3. ඩබ්. පී. හපුආරච්චි මහතා
4. ශාන්ත කුමාර මහතා
5. ආචාර්ය එස්.එම්.ජේ. ධර්මකීර්ති මහතා

<u>අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමි කාරිත්වය</u>

අධ්‍යක්ෂවරුන් සමාගමේ එකම කොටසකටවත් හිමිකම් නොකියයි.

<u>කොන්ත්‍රාත්තුවලින් අධ්‍යක්ෂවරුන්ට ලැබෙන පොලිය</u>

සමාගම සමඟ ඇති කිසිදු කොන්ත්‍රාත්තුවකින් අධ්‍යක්ෂවරුන්ට සෘජු හෝ වක්‍ර පොලියක් නොලැබේ.

<u>විගණකවරු</u>

සමාගමේ වර්තමාන විගණක වරයා වන්නේ ශ්‍රී ලංකාවේ ජාතික විගණන කාර්යාලය යි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි

සමාගමේ ලේකම්

.

ජාතික විගණන කාර්යාලය

මගේ අංකය: PAS/B/MSL?01/20/05 දිනය: 2022.02.15

සභාපති

මාන්තායි සෝල්ට් ලිමිටඩ්,

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන පරිච්ඡේදය ප්‍රකාරව 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනයේ මූල්‍ය ප්‍රකාශණ සහ අනෙකුත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව.

ඉහත සඳහන් වාර්තාව මේ සමඟ එවනු ලැබේ.

ඩබ්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් : 01. ලේකම් - කර්මාන්ත අමාත්‍යාංශය

02. ලේකම් - මුදල් අමාත්‍යාංශය

සභාපති

මාන්තායි සෝල්ට් ලිමිටඩ්,

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන පරිච්ඡේදය ප්‍රකාරව 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනයේ මූල්‍ය ප්‍රකාශණ සහ අනෙකුත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශණ

1.1 විගණක මතය

2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ විස්තීරණ ආදායම් ප්‍රකාශය, සමකොටස් වෙනස්වීම් ප්‍රකාශය සහ වර්ෂය අවසන් වන විට මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශයක් ඇතුළු මූල්‍ය ප්‍රකාශණ සඳහා වන සටහන් වලින් සමන්විත වන මාන්තායි සෝල්ට් ලිමිටඩ් ("සමාගම") හි 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනය කිරීම, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධානවලට සමගාමීව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154 (1) ව්‍යවස්ථාවේ විධිවිධාන ක්‍රියාත්මක කරමින් මාගේ මඟ පෙන්වීම යටතේ සිදු කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව මා සැකසූ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ඇත.

මගේ මතය අනුව, මාගේ වාර්තාවේ විගණක මතය සඳහා පදනම නමින් වූ ඡේදයේ විස්තර කර ඇති කරුණු වල බලපෑම හැරුණු විට, ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන මඟින් මාන්තායි සෝල්ට් ලිමිටඩ් හි 2020 මාර්තු 31 දින වන විට මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන අතර, අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය සහ මූල්‍ය ප්‍රවාහය කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථීත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වේ.

1.2 විගණක මතය සඳහා පදනම

a) කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථීත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හී 17.21 පරිච්ඡේදයට අනුව වත්කම්වල ප්‍රයෝජ්‍ය කාලය තීරණය කිරීමේ දී, සමාගම විසින් වත්කම්වල අපේක්ෂිත භාවිතය, අපේක්ෂිත ක්ෂය වීම් සහ ගෙවී යෑම්, නිෂ්පාදනයේ වෙනස්කිරීම් හෝ වැඩිදියුණු කිරීම් හේතුවෙන් තාක්ෂණිකව හෝ වාණිජ්‍යමය වශයෙන් යල්පැන ගොස් ඇද්ද යන්න සළකා බැලිය යුතුය. ඊට පටහැනිව එකී කරුණු සැළකිල්ලට නොගෙන සමාගම පරිගණක උපකරණ සහ වාහන සඳහා 10% ක් භාවිතා කර තිබුණි. තවද, කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථීත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හී 17.19 පරිච්ඡේදයට අනුව සමාලෝචනයට ලක්වන වසර අවසානය දක්වා වත්කම්වල ආයු කාලය අවසන් වීම සංශෝධනය කිරීමට සහ ඉහත සඳහන් කරුණු මත ඇති කළ හැකි ඇඟවීම් ඇගයීමට සමාගම කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාවේ දී සමාගම විසින් භාවිතා කරමින් තිබූ රුපියල් 3,890,513 ක වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇත.

b) කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථීත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හී 17.33 පරිච්ඡේදයට අනුව, සමාගම විසින් පිළි ඇගයීම බලපැවැත්වෙන දිනය, තක්සේරුකරුගේ විස්තර, පිළිගත් ප්‍රමාණයන් සහ පිළි ඇගයීමේ අතිරික්තය අනාවරණය කළ යුතුය. ඊට පටහැනිව සමාගම විසින් ප්‍රාග්ධනය සහ සංචිත යටතේ පෙන්වා ඇති පිළි ඇගයූ රුපියල් 2,400,000 ක මුදල පිළිබඳ කිසිදු විස්තරයක් පෙන්වා නොතිබුණි.

c) මන්නාරම් ලුණු ලේවායේ ඉඩම්වල වටිනාකම් සහ ගොඩනැගිලිවල සහ ව්‍යුහයන්ගේ ලිඛිත වටිනාකම පිළිවෙලින් රුපියල් 42,900,000 සහ රු. 13,675,334 ක් ලෙස 2020 මාර්තු 31 වැනි දිනට වන මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර තිබුණ ද, එම වත්කම්වල හිමිකාරිත්වය සමාගමට පවරා නොගෙන සමාලෝචිත වර්ෂයේ සමාගමේ වත්කම් ලෙස පෙන්වා දී තිබුණි.

d) අලිමංකඩ ලුණු ලේවායේ ඉඩමේ අයිතිය සමාගමට පවරා ගැනීමකින් තොරව, සමාගම විසින් ලුණු ලේවායේ ගොඩනැගිළි ඉදිකිරීමට සහ අළුත්වැඩියා කිරීම සඳහා 2016/17 සිට 2018/19 දක්වා කාලය තුළ රුපියල් 83,922,553 ක් වැය කර ඇත.

තවද, අලිමංකඩ ලුණු ලේවාය පුනරුත්ථාපනය කිරීමේ කටයුතු සඳහා රජයේ සමුච්චිත ප්‍රදාන වශයෙන් 2020 මාර්තු 31 දිනට රුපියල් 96,261,491 ක් මුදා හැර තිබුණි. මෙම ප්‍රදානය ගොඩනැගිලි ඉදිකිරීම, ලුණු ලේවාය අළුත්වැඩියා කිරීම සහ වත්කම් අත්පත්කර ගැනීම යන කරුණු සඳහා පිළිවෙලින් රු. 26,601,895 ක්, රු. 57,320,658 ක් සහ රු. 12,338,938 ක් යොදාගෙන තිබුණි. කෙසේ වෙතත්, සමාගම මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ අදාළ කාණ්ඩය යටතේ මෙම වත්කම් හඳුනාගෙන නොතිබූ අතර, ඒ අනුව අගය ක්ෂය කර නොතිබුණි..

එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ රජයේ ප්‍රදානය අඩු වීම, 2020 මාර්තු 31 දිනට රුපියල් 4,374,147 කින් අඩු කර දක්වා ඇත.

e) මන්නාරම සහ අලි මංකඩ ලුණු ලේවායන් හී ගොඩනැගිලි ක්ෂය ගණනය කිරීම සඳහා පූර්ව නිශ්චිත 5% ක ක්ෂය අනුපාත වෙනුවට 10% ක ක්ෂය අනුපාත භාවිතා කිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ක්ෂයවීම රුපියල් 1,534,553 කින් වැඩිපුර දක්වා තිබුණි.

f) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 16 (2) (ආ) වගන්තියට අනුව, තක්සේරු වර්ෂය අවසානයේ සමාගම සතු හෝ භාවිත කළ ක්ෂය කළ හැකි වත්කම් සඳහා ප්‍රාග්ධන දීමනාව අඩු කළ හැකිය. ඊට පටහැනිව, සමාගම විසින් 2020 මාර්තු 31 දින දක්වා රජයේ ප්‍රධානයන් වශයෙන් වූ රුපියල් 9,422,796 ක මුදලක් භාවිතා කරමින් මිලදී ගන්නා ලද වත්කම් සඳහා තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීම සඳහා ප්‍රාග්ධන දීමනා ලෙස සලකා නොතිබුණි. සමාලෝචිත වර්ෂය රු. 263,838 කි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදන වැඩියෙන් සඳහන් කර තිබූ අතර, වර්ෂයේ ලාභය රු. 263,838 කින් අඩුවෙන් සටහන් කර තිබුණි.

g) අලිමංකඩ ලුණු ලේවායේ ඇති ලුණු තොගයේ 2019 මාර්තු 31 වන දිනට භෞතික සත්‍යාපන වාර්තාව සහ පොත්වල සඳහන් ශේෂය අතර වෙනස මෙට්‍රික් ටොන් 1,307.36 ක් වූ අතර එය තොගවලින් සියයට 8.6 ක් වන වා මෙන් ම දළ වශයෙන් රුපියල් 5,459,535 ක වටිනාකමට සමාන වේ. (සභාපතිවරයාගේ කරුණු දැක්වීමට අනුව අනුමත ප්‍රතිශතය සියයට 1 කි). මෙම වෙනස 2016 වර්ෂයේ සිට ඉදිරියට එකතු වී ඇත. කෙසේ වෙතත්, සමාගම කොටස් හිඟය පිළිබඳව සොයා බැලීමට සහ මූල්‍ය ප්‍රකාශනවල එය සකස් කිරීමට කටයුතු කර නොතිබුණි..

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuS) අනුව සිදු කරන ලදී. එකී ප්‍රමිතීන්ට අනුව, මාගේ වගකීම්, මාගේ වාර්තාවේ "මූල්‍ය ප්‍රකාශණ විගණණය සඳහා වන විගණකගේ වගකීම්" යන ඡේදයේ ද තවදුරටත් විස්තර කර ඇත. මාගේ විගණන මතයට පදනමක් සැපයීම සඳහා මා විසින් ලබාගන්නා ලද විගණන සාක්ෂි, ප්‍රමාණවත් සහ සුදුසු යැයි මම විශ්වාස කරමි.

1.3 සමාගමේ 2019/20 වර්ෂයේ වාර්ෂික වාර්ථාවේ ඇතුලත් අනෙකුත් තොරතුරු.

අනෙකුත් තොරතුරු, සමාගමේ 2019/20 වාර්ෂික වාර්තාවේ ඇතුලත් කොරතුරු වලින් සමන්විත වන නමුත්, මෙම විගණන වාර්තාවේ දිනට පසුව මා වෙත සැපයීමට අපේක්ෂිත මූල්‍ය ප්‍රකාශණ සහ ඒ පිළිඹඳ මාගේ විගණන වාර්තාව ඇතුලත් නොවේ. අනෙකුත් තොරතුරු සම්බන්ධයෙන් කළමණාකාරිත්වය වගකිව යුතු වේ.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ මතය අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳව කිසිදු ආකාරයක සහතික නිගමනයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනය සම්බන්ධයෙන්, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට ඒවා අධ්‍යයනය කිරීම සහ සහ එසේ කිරීමේදී, අනෙකුත් තොරතුරු, මූල්‍ය ප්‍රකාශන හෝ විගණනයේදී ලබාගත් මගේ දැනුම් සමඟ ප්‍රමාණාත්මකව නොගැලපේද යන්න හෝ වෙනත් ආකාරයකින් ප්‍රමාණාත්මක අවප්‍රකාශණ ඇති බවක් පෙනෙන්නට තිබේද යන්න සලකා බැලීමයි. මා විසින් සමාගමේ 2019/20 වර්ෂයේ වාර්ෂික වාර්තාව අධ්‍යයනය කිරීමේ දී එහි වැදගත් අවප්‍රකාශණයන් ඇති බවට මා විසින් නිගමනය කරන්නේ නම්, ඒවා නිවැරදි කිරීම සඳහා පරිපාලනයට සම්බන්ධ අය වෙත එම කාරණය දැනුම් දීමක් කිරීමට මට අවශ්‍ය වේ. තවදුරටත් නිවැරදි නොකළ වැදගත් අවප්‍රකාශ තිබේ නම් ඒවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන අනුව, යථා කාලයේ දී මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකාර මණ්ඩලයේ සහ පාලන කාර්යය පැවරී ඇති තැනැත්තන්ගේ වගකීම්.

කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන අයුරින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ වැරදි හෝ වංචා හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීමට අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කළමනාකාරීත්වය වගකීම දරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී , සමාගම ඇවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට හෝ එසේ කිරීම හැර වෙනත් යථාර්ථවාදී විකල්පයක් නොමැති බව කළමණාකාරිත්වය අදහස් නොකරන්නේ නම්, ආයතනය අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යාමට සමාගම සතු හැකියාව තක්සේරු කිරීම, අඛණ්ඩව පවත්වාගෙන යාම හා සම්බන්ධ උපයෝගී කරුණු අනාවරණය කිරීම සහ ගිණුම් කරණයේ අඛණ්ඩ පදනම භාවිතා කිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය විසින් වගකිව යුතුය.

පාලන කාර්යය පැවරී ඇති තැනැත්තන් සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම කෙරෙහි වගකිව යුතු වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය අනුව සමාගමේ වාර්ෂික සහ වාරික මූල්‍ය ප්‍රකාශණය පිළියෙල කිරීමට හැකිවන අයුරින්, සමාගම සිය සියළුම ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් සම්බන්ධයෙන් නියමිත පොත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

1.5 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීමේ දී විගණකගේ වගකීම.

වංචා සහ වැරදි හේතුවෙන්, සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශණය වැදගත් අවප්‍රකාශනයන්ගෙන් තොර වන්නේ ද නැද්ද යන්න පිළිබඳව සාධාරණ සහතිකයක් ලබා ගැනීම සහ මාගේ උපදෙස් ඇතුලත් විගණන වාර්තා නියෝගයක් නිකුත් කිරීම මාගේ පරමාථයයි. සාධාරණ සහතිකයක් යනු ඉහළ මට්ටමේ සහතිකයක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන ලද විගණනයක් සෑම විටම වැදගත් අවප්‍රකාශණ පවතින විට ඒවා හඳුනාගනු ඇති බවට සහතිකයක් නොවේ. අවප්‍රකාශණ, වංචා හෝ වැරැද්දකින් ඇතිවිය හැකි අතර, ඒවා තනි තනිව හෝ සමස්තයක් වශයෙන් ගත් කල, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ගනු ලබන පරිශීලකයින්ගේ ආර්ථික තීරණවලට බලපෑම් කරනු ඇතැයි ඔවුන් සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකිය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන විගණනයක කොටසක් ලෙස, මම වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කරන අතර විගණනය පුරාම වෘත්තීය සැකය පවත්වා ගනිමි. තවද මවිසින්,

- වංචාවට කුමන්ත්‍රණය, කූට ලේඛණ සැකසීම, හිතා මතා සිදු කරන පැහැරහැරීම්, අවනිදේශණ, හෝ අභ්‍යන්තර පාලනය ඉක්මවා යාම සම්බන්ධවන බැවින්, වංචාව නිසා ඇතිවන වැදගත් අවප්‍රකාශන හඳුනා නොගැනීමේ අවධානම වැරදි නිසා සිදුවන වැදගත් අවප්‍රකාශණ හඳුනා නොගැනීමේ අවධානමට වඩා වැඩි වේ. එබැවින් වංචා හෝ දෝෂ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සිදුවන වැදගත් අවප්‍රකාශණයන්හී අවදානම හඳුනාගෙන ඒවා තක්සේරු කිරීම, එම අවදානම් වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ මගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදු කරමි,
- ඒ ඒ අවස්ථාවන්ට යෝග්‍ය වන පරිදි විගණන ක්‍රියා පටිපාටි සැළසුම් කිරීමේ අරමුණින් විගණනයට අදාල වන අභ්‍යන්තර පාලනය පිළිබඳව සැළකිල්ලට ගන්නා නමුත්, සමාගමේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීතාවය සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල යෝග්‍යතාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද අනාවරණය කිරීම් ඇගයීම ද,
- ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමට සමාගමට ඇති හැකියාව සම්බන්ධයෙන් සැළකියයුතු සැකයක් ඇති කරවන සිද්ධීන් සහ තත්වයන් හා සම්බන්ධ වැදගත් අවිනිශ්චිතතාවන් පවතින්නේ ද යන්න, ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම්ව සහ ගිණුම්කරණයේ අඛණ්ඩත්වය මත කළමනාකරණ භාවිතයන්ගේ යෝග්‍යතාවය නිශ්චය කිරීම ද, වැදගත් අවිනිශ්චිතතාවයන් පවතින්නේ යැයි මා නිශ්චය කරන්නේ නම්, මාගේ මතය වෙනස් කිරීමට එවැනි හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මූල්‍ය ප්‍රකාශණවල අදාල අනාවරණය කිරීම් සම්බන්ධයෙන් මාගේ

විගණන වාර්තාව වෙත අවධානය යොමු කරවීම අවශ්‍ය වේ. මාගේ නිගමනය, මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා මා විසින් ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාම නතර කිරීම හේතු විය හැකිය.

- අනාවරණය කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශන සාධාරණ ඉදිරිපත් කිරීමක් ලබා ගන්නා අයුරින් ඉස්මතු කරන ලද ගනුදෙනු සහ සිදුවීම් නියෝජනය කරන්නේද යන්න තක්සේරු කිරීම ද කරනු ලැබේ.

අනෙකුත් කරුණු අතර, මාගේ විගණනයේදී මා හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලන කාර්යය පැවරී ඇති තැනැත්තන් සමඟ මම අදහස් හුවමාරු කර ගනිමි.

2 අනෙකුත් නෛතික සහ නියාමන අවශ්‍යතා සම්බන්ධ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනත සහ 2007 අංක 07 දරණ සමාගම් පනත් හි පහත සඳහන් අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුලත් වේ.

2.1.1 විගණන මතය සඳහා පදනම නම් වූ කරුණු පිළිබඳ පරිච්ඡේදයේ විස්තර කරන ලද කරුණුවල බලපෑම හැරුණු විට, විගණනයට අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගෙන ඇති අතර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ 163(2)(ඇ) වගන්තියේ අවශ්‍යතාවන්ට අනුකූලව සමාගම විසින් නිසි පරිදි ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් ඇති බව තවදුරටත් මාගේ පරීක්ෂණවලින් විද්‍යාමාන වේ.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශණ, 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවන්ට අනුකූලවේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ නියමයට අනුව, ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශණ පෙර වර්ෂයට අනුකූල වේ.

2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ නියමයට අනුව, ඉදිරිපත් කරණ ලද මූල්‍ය ප්‍රකාශණවල මා විසින් පෙර වර්ෂයේ කරන ලද සියළුම නිර්දේශයන් ඇතුලත් වේ.

2.2 අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටි සහ වැදගත් කරුණුවලට සීමා වී ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වූ කරුණු හැර ,

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ නියමයන්ට අනුව, සමාගම විසින් ඇතුලත්වන කිසිදු කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් සමාගමේ පාලන මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙකුට සාමාන්‍ය ව්‍යාපාර පටිපාටියෙන් බැහැරව,සෘජු හෝ වක්‍ර බැඳියාවක් තිබූ බවට සඳහන් කිරීමට කිසිවක්, හෝ,

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුව කිසිදු උපයෝගී ලිඛිත නීතියකට හෝ සමාගමේ පරිපාලන මණ්ඩලය විසින් නිකුත් කරන ලද සාමාන්‍ය සහ විශේෂ නියමයන් සමඟ අනුකූල නොවන බව සඳහන් කිරීමට කිසිවක් හෝ,

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 12(උ) වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුව, සමාගම විසින් එහි බලතල, කාර්යයන් සහ රාජකාරීවලට අනුකූල නොවන ලෙස කටයුතු කළ බවට සඳහන් කිරීමට කිසිවක්, හෝ

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ නියමයට අනුව, සම්පත් කාල රාමුව තුළ සහ අදාළ නීතිවලට අනුකූලව සකසුරුවම්ව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස සමාගමේ සම්පත් ප්‍රසම්පාදනය කර සහ ප්‍රයෝජනයට ගෙන නොමැති බවට සඳහන් කිරීමට කිසිවක් හෝ,

මාගේ අවධානයට ලක් නොවිණි.

2.3 <u>අනෙකුත් කරුණු</u>

වසර දෙකක් තුළ ඉතිරිව තිබූ රුපියල් 1,577,310 ක ආර්ථික සේවා ගාස්තුව අයකර ගැනීමට සමාගම පියවර ගෙන නොතිබුණි. තවද, රුපියල් 673,493 ක ආදායම් බදු ප්‍රතිපාදන වසර 04 ක් පුරා පියවා නොතිබූ අතර, ගෙවා ඇති රුපියල් 1,193,214 ක රඳවා ගැනීමේ බද්ද නැවත අයකර ගෙන නොතිබුණි.

ඩබ්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

විගණනය කරන ලද ගිණුම්

2019/2020

මාන්තායි සෝල්ට් ලිමිටඩ්

2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශණ

මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනය **(පිටුව 01)**

2020 මාර්තු මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය.

		2020	2019
	සටහන්	රු.	රු.
ආදායම්	(3)	103,473,982	155,380,640
විකුණුම් පිරිවැය		(84,303,766)	(108,339,171)
දළ ලාභය		19,170,216	47,041,469
අනෙකුත් මෙහෙයුම් ආදායම්	(4)	12,414,565	14,715,364
		31,584,782	61,756,833
පරිපාලන වියදම්		(18,368,420)	(18,866,533)
විකුණුම් සහ බෙදා හැරීමේ වියදම්		(875,422)	(1,037,255)
මෙහෙයුම් ලාභය		12,340,940	41,853,045
මූල්‍යමය වියදම්	(5)	(42,696)	(116,868)
බදු ගෙවීමට පෙර ලාභය	(6)	12,298,244	41,736,177
ආදායම් බදු	(7)	498,090	(6,559,465)
වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ලාභය		12,796,333	35,176,712

මාන්තායි සෝල්ට් ලිමිටඩ්

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

		2020	2019
වත්කම්	සටහන්	රු.	රු.
ජංගම නොවන වත්කම්			
දේපළ සහ උපකරණයන්තු ,	(8)	149,768,539	154,751,368
මූල්‍යමය වත්කම්	(9)		44,000,000
		149,768,539	198,751,368
ජංගම වත්කම්			
පරිලේඛණ(ඉන්වෙන්ට්‍රි)	(10)	82,200,826	61,098,538
වෙළඳ සහ අනෙකුත් ලැබීම්	(11)	5,408,790	9,327,017
මුදල් සහ මුදල්වලට සමාන දෑ	(12)	59,127,976	33,167,123
		146,737,592	103,592,678
මුළු වත්කම්		296,506,131	302,344,046
කොටස් හා වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	(13)	30,000,000	30,000,000
ප්‍රත්‍යාගණිත සංචිත		2,400,000	2,400,000
ආදායම් සංචිත	(14)	174,269,602	161,473,269
සම්ස්ත කොටස්		206,669,602	193,873,269
ජංගම නොවන වගකීම්			
රජයේ ප්‍රතිපාදන	(15)	67,883,015	77,509,163
වලම්බිත බදු බැරකම්(වත්කම්)/	(16)	(70,342)	2,387,386
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	(17)	9,366,428	9,000,149
		77,179,101	88,896,698
ජංගම වගකීම්			
වෙළඳ හා අනෙකුත් ගෙවීම්	(18)	13,377,845	17,805,614
ගෙවිය යුතු ආදායම් බදු	(19)	(720,417)	17,768,465
		12,657,428	19,574,079
සම්ස්ථ කොටස් සහ වගකීම්		296,506,131	302,344,046

මෙම මූල්‍ය ප්‍රකාශණ .තාවයන්ට අනුකූල වේදරන සමාගම් පනතේ අවශ්‍ය 07 අංක 2007

---------- 25/03/2021

මූල්‍ය කළමනාකරු දිනය

මෙම මූල්‍ය ප්‍රකාශණ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේක්ෂ මණ්ඩලය අධ්‍ය . ,වෙනුවෙන්

	නම	අත්සන
අධ්‍යක්ෂ 1	එච්විජේතුංග .ජී.	----------
අධ්‍යක්ෂ 2	ආර්බණ්ඩාර .සී.එස්.ජී.යූ.එම්.ඩී.	----------

අනුමත කර අත්සන් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අත්සන් කරන ලද දිනය 25/03/2021

මාන්තායි සෝල්ට් ලිමිටඩ්

2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සම කොටස් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණිත සංචිත	ආදායම් සංචිත	එකතුව
වන 01 ල්අප්‍රේ 2018 දිනට ශේෂය	30,000,000	2,400,000	126,296,557	158,696,557
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	-	35,176,712	35,176,712
දිනට 31 මාර්තු 2019 ශේෂය	30,000,000	2,400,000	161,473,269	193,873,269
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	-	12,796,333	12,796,333
2020මාර්තු දිනට 31 ශේෂය	30,000,000	2,400,000	174,269,602	206,669,602

මාන්තායි සෝල්ට් ලිමිටඩ්

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය.

	2020	2019
මෙහෙයුම් කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහය	රු.	රු.
බදු ගෙවීමට පෙර මෙහෙයුම් ලාභය(පාඩුව)/	12,298,244	41,736,177
ගැලපීම්		
ක්ෂය	4,535,209	3,027,833
ක්‍රමක්ෂය		
පාරිතෝෂික ප්‍රතිපාදන	1,710,305	1,325,791
ස්ථිර තැන්පතු පොලී ආදායම්	(628,251)	(2,420,732)
තැන්පතු පොලී ආදායම්	(1,129,436)	(2,148,060)
	4.487.827	(215,169)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්වලට පෙර වර්ෂය සඳහා මෙහෙයුම් ලාභය	16,786,070	41,521,009
කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම්		
පරිලේඛණයන් (අඩුවීම්)/හී වැඩිවීම් (ඉන්වෙන්ට්‍රි)	(21,102,288)	4,478,821
වෙළඳ සහ අනෙකුත් ලැබීම් හී අඩුවීම් /(වැඩිවීම)	3,918,227	16,409,343
වෙළඳ සහ අනෙකුත් ගෙවීම් හී අඩුවීම් /(වැඩිවීම)	(4,427,769)	(4,742,121)
	(21,611,830)	16,146,043
මෙහෙයුම් තුලින් ජනනය වූ මුදල්	(4,825,759)	57,667,051
පාරිතෝෂික ගෙවීම්	(1,344,026)	(222,313)
ආදායම් බදුරඳවාගත් බදු ගෙවීම්/	(4,448,519)	(7,145,174)
	(5,792,544)	(7,367,487)
මෙහෙයුම් කටයුතු තුලින් ගලා ආ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	(10,618,304)	50.299.564
ආයෝජන කටයුතුවල මූල්‍ය ප්‍රවාහය		
දේපළ සහ උපකරණයන්ත ,	(9,178,530)	(18,237,470)
ලුණු ලේවායන් ප්‍රතිසංස්කරණ වියදම්	-	(4,999,700)
ආයෝජන ඉවත්කර ගැනීම්	44,000,000	16,147,501
ස්ථාවර තැන්පතුවල ආයෝජනය	-	((44,000,000)
ස්ථිර තැන්පතු පොලී ආදායම්	628,252	2,420,732
තැන්පතු පොලී ආදායම්	1,129,436	2,148,060
ආයෝජන කටයුතුවලින් ගලා ගිය ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	36.579.157	((46,520,876

මුදල් යෙදවීමේ කටයුතුවල මූල්‍ය ප්‍රවාහය		4,999,700
රජයේ ප්‍රතිපාදන ලැබීම්		
මූල්‍ය කටයුතුවලින් ගලා ආ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	-	4,999,700
වර්ෂය තුළ මුදල් සහ මුදල්වලට සමාන දෑවල ශුද්ධ වර්ධනය	25,960,854	8,778,388
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් වලට සමාන දෑ	33,167,123	24,388,735
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල්වලට සමාන දෑ	59,127,977	33,167,123
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල්වලට සමාන දෑ විශ්ලේෂණය කිරීම		
බැංකුවේ ඇති මුදල්	59,109,372	33,150,241
අතැති මුදල්	18,605	16,882
	59,127,977	33,167,123

මාන්තායි සෝල්ට් ලිමිටඩ්

2020 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්.

1. සංස්ථාපිත තොරතුරු

1.1 වාර්තාකරණ අස්තීත්වය

මාන්තායි සෝල්ට් ලිමිටඩ් යනු ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය (පූර්ණ වශයෙන් රජයට අයත්) යටතේ ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත සීමිත වගකීම් සහිත රාජ්‍ය ව්‍යාපාර සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 05, ඇල්විටිගල මාවතේ 561/3 දරන ස්ථානයේ පිහිටා ඇති අතර, ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ග්‍රෑන්ඩ් බසාර්, මන්නාරම සහ එලිපන්ට්පාස් යන ස්ථානයන්හී පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදනයේ දීර්ඝ ඉතිහාසය ඉදිරියට ගෙන යාමයි. එම ආයතනය සාමාන්‍ය ලුණු නිෂ්පාදනය කරන අතර ඒවා කැට ලුණු, සහ කාර්මික ලුණු ආකාරයට ශ්‍රී ලංකාව තුළ බෙදා හරිනු ලැබේ.

1.3 අංක (05) සිට (26) දක්වා පිටුවල දක්වා ඇති මූල්‍ය ප්‍රකාශණය සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් ලෙස අකණ්ඩව පවතී.

1.4 වර්ෂය අවසාන වන විට සේවක සංඛ්‍යාව 67 කි (2019-66)

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය.

2.1 සමානත්‍ය ප්‍රතිපත්ති

2.1.1 අනුකූලතා ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශය, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ නිර්ණායකයන්ට අනුකූලව පිරිවැය මත පදනම්ව සකස් කර ඇත.

මාන්තායි සෝල්ට් ලිමිටඩ්
2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය
සඳහා වන මූල්‍ය ප්‍රකාශණ සඳහා වන සටහන්

2.1.2 සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශණ ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශණ ශ්‍රී ලංකා රුපියල් (රු.) වලින් ඉදිරිපත් කරන අතර, ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලබන සියළු මූල්‍ය තොරතුරු ආසන්න රුපියලට වටයා ඇත. සමාගමේ මූල්‍ය ප්‍රකාශයන් ඓතිහාසික පිරිවැය සම්මුතිය මත සකස් කර ඇත.

වර්තමාන නිරූපනය සමඟ සනාත කිරීම සඳහා, අවශ්‍ය ව්‍යවස්ථාවන් හී වර්තමාන වර්ෂය සඳහා වන ඉදිරිපත් කිරීම් සමඟ ගැලපෙන පරිදි සංසන්දනාත්මක තොරතුරු අවශ්‍ය පරදි නැවත වර්ගීකරණ කර නොමති නම් සහ වෙනත් ආකාරයකින් ප්‍රකාශකර නොමැති නම් සමාගම විසින් භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුරූප වේ.

2.1.3 අඛණ්ඩභාවය

අධ්‍යක්ෂවරුන් විසින්, සමාගම ඉදිරියට පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර, ඔවුන් එය ඇවර කිරීමට හෝ වෙළඳාම නතර කිරීමට අදහස් නොකරයි.

2.1.4 ඇස්තමේන්තු සහ නීන්දු භාවිතා කිරීම

ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදවුම් සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම කළමනාකාරීත්වයට අවශ්‍ය වේ. තථ්‍ය ප්‍රතිඵල ඇස්තමේන්තුගත ප්‍රතිඵලවලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වූ උපකල්පන පදනම් වී ඇත්තේ ඓතිහාසික අත්දැකීම් සහ ඒ ඒ තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් ඇතුළු විවිධ සාධක මත ය.

ඇස්තමේන්තු සහ මූලික වූ උපකල්පනයන්, කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යන්නේ යැයි යන පදනම මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාල පරිච්ඡේදය තුළ සහ බලපෑමට ලක්වන ඕනෑම අනාගත කාල පරිච්ඡේදයන් තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන හඳුනා ගැනේ.

2.1.5 <u>වැදගත්කම් සහ සමූහණය</u>

සමාන අයිතමවලින් යුතු සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. ස්වභාවයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් අසමාන අයිතම ඒවා වැදගත් වන්නේ නම්වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

2.1.6 <u>වාර්තාකරන කාල පරිච්ඡේදයෙන් පසුව සිදුවී ඇති වැදගත් සිදුවීම්.</u>

වර්තාගත කරන ලද දිනට පසුව සිදු වී ඇති සිදුවීම් වල වැදගත්කම සළකා බලා ඇති අතර, අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැලපීම් සහ අනාවරණය කිරීම් සිදු කර ඇත.

ඉදිරියට....

මාන්තායි සෝල්ට් ලිමිටඩ්
2020 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය
සඳහා වන මූල්‍ය ප්‍රකාශණය සඳහා සටහන්

2.1.7 බදුකරණය

(අ) ප්‍රවර්තන බදු

බදු අය කිරීම සඳහා වන ගාස්තුව පදනම් වන්නේ, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව බදු අය නොකරණ භාණ්ඩ සඳහා ගැලපීම් කරන ලද වාර්ෂික ආදායම මත ය.

